# 'අපට ලොක්කන් නැතුවම බැරි ද?
## පශ්චාත් අරගල දේශපාලන සන්දර්භය පිළිබඳ මහජන අදහස්' රැගත්

**නීතිය හා සමාජ භාරය විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රකාශනය එළිදැක්වීමට සමගාමී ව 2023 මාර්තු 31 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වුනු සාකච්ඡාවේ දී පවිත්‍රා ජයවර්ධන විසින් සිදුකළ අදහස් දැක්වීම**



"අපි හැමෝම කැමතියි හොඳ පුරවැසියන් ලෙස පෙනී සිටින්න. අපි අරගලයේදීත් අපි හැම තිස්සෙම අපේ එකට සම්බන්ධ වෙච්ච අය නීතිය ඇතුලේ සිටිමින් තමයි තමන්ගේ ප්‍රතිවිරෝධතාව පෙන්නුවේ. ඒක civil disobedience කියන තත්ත්වයකට ගියේ නැහැ. ඒක අවසානයේ රනිල් පත්වෙනව. බැලු බැල්මට යුක්තිය අතින් බැලුවොත් අපිට පේනවා මේක අවුල්, මේක වැරදියි. mandate එකක් නැහැ. mandate reverse කරලා තියෙන්නේ. ඒ reverse කරපු mandate එක උඩ ආපහු බලය මාරුවෙලා තියෙනවා. හැබැයි අනිත් පැත්තට රනිල් කියනවා අපිට "මම කිසිදෙයක් ව්‍යවස්ථාවට පිටින් කරන්නේ නැහැ". හැමදාම කියනවා, මම හිතන්නේ දවසට තුන් හතරවතාවක් කියනවා. මේක තමයි නීතිය, නීතියට අනුව මේක හරි කිව්වාට පස්සේ අපිට ඒක තමයි අපේ end point එක වගේ හිතන ගතියක් අපේ තියෙනවා. නීතිය ද සියල්ලට ඉහළින් ඉන්නේ, එතකොට නීතිය හදන්නේ කවුද? නීතියෙන් මොකක් ද reflect වෙන්න ඕනි. නීතියෙන් reflect වෙන්න ඕනි යුක්තිය නෙමේද ? යුක්තියත් නීතියත් එකිනෙකට පරස්පර වෙන තැනකදී අපි හිටගන්න ඕනි නීතියේ පැත්තද? යුක්තියේ පැත්ත ද? මේක නීතියේ එක්තරා විදියක උභතෝකෝටිකයක්."

අරගලය වෙන්න කළින් අපේ සමාජ විද්‍යාඥයින්ට ගොඩකට තිබුණු නිරීක්ෂණය තමයි ලංකාවේ පුරවැසියා කියන්නේ passive citizen කෙනෙක් කියන එක. ඒ කියන්නේ අවුරුදු 6 කට සැරයක් ඡන්දයකට යනවා එතනින් එහාට වගකීමක් දරන්නේ නැහැ කියන එක. දැන් අරගලය මේක problematic කරලා තියෙනවා මේක දිහා විවිධ අර්ථකථනවලින් බලන්න පුළුවන්. බැලු බැල්මට පේනවා අපි හිතන් හිටපු passive citizen කියන එක දැන් තවදුරටත් කියන්න අමාරු තත්ත්වයක් තියෙනවා කියල. මොකද ඒ වෙනස් කරන්න බැහැ කියලා හිතපු යථාර්ථයක් වෙනස් වෙලා තියෙනවා, ගෝඨාභය ගෙදර යෑම හරහා. එහෙම නම් මට පෙනෙනවා මෙතන එකවිට මතු වෙච්ච ප්‍රශ්න දෙකක් තියෙනවා උභතෝකෝටිකයක් හැටියට. දැන් මේ පොතේ නමත් "අපිට ලොක්කන් නැතිවම බැරි ද?" එතකොට ලොක්කන්ගේ ප්‍රතිවිරුද්ධාර්ථය සොක්කන් කියලා ගමු කෝ. ප්‍රභූ නම් නිර්ප්‍රභූ අපිට එහෙම යන්න පුළුවන්. බලය සහිත-බලය නැති ඕන විදියකට යන්න පුළුවන්. binary එකක් නේ. අපි ප්‍රතිවරුද්ධ කුලක දෙකක් කියලා හිතනවා. බලය විෂම විදියට බෙදිලා ගිහිල්ලා කියලා හිතනවා. එතකොට අපිට අවශ්‍යයි එක පැත්තකින් මේ ලොක්කන් නොවන පිරිස vocal වෙන්න නැතිනම් සක්‍රීයව දායකවෙන්න යම් දෙකකට. අපි හිතමු දේශපාලනිකව ඒගොල්ලෝ ක්‍රියාත්මක වීම අපට අවශයයි. හැබැයි අනිත් උභතෝකෝටිකය තමයි ඇත්තටම එහෙම ක්‍රියාත්මක වුණා කියලා අපි හිතමු, අපි හිතමු දැන් අපේ රටේ ඉන්න සියලුම පුරවැසියන් ඉතාම සාධනීය සක්‍රිය පුරවැසියන් වුනා කියල. අපිට ප්‍රමාණවත් ද අපිට මේ තියෙන ආයතන සහ අදහස් පද්ධතිය ඇතුලෙ ඒකට ඉඩ හදන්න. අපිට ඒකත් එක්ක සමීප වෙන්න අපි හදාගෙන

ඉන්න පද්ධතිය ප්‍රමාණවත් ද, ඒගොල්ලෝ ඇත්තටම කතා කරන්න ගත්තොත් කියන ප්‍රශ්නය මම කැමතියි ඉදිරිපත් කරන්න.

දැන් උදාහරණයක් විදියට අපි අරගල භූමිය හිතුවොත් දැන් තියෙන කතාවක් තමයි ඒක පරිහානියට ලක්වෙන්න හේතුව තමයි ඒකට නිශ්චිත නායකයෙක් හිටියේ නැහැ, ඒකට ධූරාවලිගත වෙච්ච සංවිධාන තිබ්බේ නැහැ, ඒක හැමොගේම එකක්, හැමෝගෙම එකක් වුණාම කොහොමද ඒක පාලනය වෙන්නේ, පාලනය කර ගන්නේ. governance කියන අදහසින් මං කියන්නේ. නැත්නම් මේ ලොක්කන්ගේ පාලනය කියන අදහසින් නෙමේ. යම්කිසි සමාජයක ජීවත් විමේදී governance එකක් තියෙන්න එපැයි. ක්‍රමය පවත්වා ගෙන යැමේ ධූරාවලියක් order එකක් තියෙන්න ඕනි. එතකොට කොහොම ද අපි ඒක කරගන්නේ කියන ප්‍රශ්නය. මේක මම හිතනවා අපේ රටට විතරක් සීමා නොවී ජාතික රාජ්‍ය කියන unit එකේ ප්‍රශ්නයක් ද මේක කියලා අහන්න. ඒ කියන්නේ එකම වේලාවක මේ දෙකම අපි කොහොම ද balance කරගන්නේ? දැනට පවතින දැනුම අනුව තියෙන එක තමයි ජාතික රාජ්‍ය කියලා ඒකකයක් තියෙනවා, ඒක නිර්මාණය වෙන්නේ වෙනම අත්දැකීමක් පදනම් කරගෙන, විශේෂයෙන් යුරෝපයේ ජාතික රාජ්‍ය කියන අදහස එන්නේම ජාතික රාජ්‍ය ඇතුළේ වෙන්නේ මොකක්ද කියන එක ගැන අදහසකට වැඩිය ජාතික රාජ්‍ය අතර සාමය පවත්වාගෙන යැමේ අදහසින්. ඒ කියන්නේ boder එක clear වුණාම තමයි ඒ දෙගොල්ලෝ අතර ප්‍රශ්න අඩුකර ගන්න පුළුවන්. කුරුස යුද්ධය ඇවිල්ලා ඒක නතර කර ගන්න මේ පාලනය ඒකක ටික coexist වෙන්නේ කොහොම ද? එකවිට එකිනෙකාව ආක්‍රමණය කර ගන්නේ නැතිව ඉන්නේ කොහොමද ? කියන අදහසින් තමයි මම හිතන හැටියට ඇතුළත ගැන තියෙන emphasis එක, ඒ කියන්නේ අවධානයට වැඩිය ජාතික රාජ්‍ය අතරේ තියෙන සම්බන්ධතාව ගැන හිතලා තමයි ජාතික රාජ්‍ය කියන වචනය එන්නේ. නමුත් ඒකේ යුරෝපානු අත්දැකීම තමයි ජාතික රාජ්‍ය කියන එක ජාතිය සමානයි රාජ්‍ය කියන එක. සම ජාතික අදහසකින් ඒක එන්නේ.

අපි 1940 ගණන්වල අපි ස්වධීන රාජ්‍ය නෙමේ, අපි යටත්යවිජිත (colonial). අපි ඇත්තටම පැවතුණු රාජ්‍යවත් නෙමේ. අපි ඉතිහාසය විදියට ගන්නේ අවුරුදු 75 නේ, අවුරුදු 75 ක් ඇතුලෙ අපිට මොකද වුනේ කියලා අපි අහන්නේ. අපිත් පරිකල්පනය කරන්නේ නැහැ අපි පැවතිච්ච ඒකකයක් හැටියට. 40 ගණන්වලදී අපි කියන්නේ යටත්විජිතකරණය වූ ගෝලීය දකුණේ තිබ්බ යටත්යවිජිත. මේවා සෙවරී රාජ්‍ය බවට පත්වෙන වෙලාව වෙද්දී ලෝකය නිර්මාණය වෙලා තිබුණ යම්කිසි ව්‍යුහයක් තිබුණා. ජාතික රාජ්‍ය ආකෘතිය (model) එක්ක. ජාතික රාජ්‍යක් වෙන්න නම් අනෙක් රටවල පිළිගැනීම (recognition) ඕන. පිළිගැනීම හම්බ වෙන්න නම් legitimate government එකක් ඕනි. එහෙම වුනොත් තමයි ඒ ඒ ඒකක අතර සම්බන්ධතා පවත්වා ගෙන යන්න පුළුවන්. ඒ සම්බන්ධතා පවත්වා ගෙන යැම වැදගත්. මොකද වෙළඳපල යම්කිසි විදියකට සම්බන්ධිතයි. ඒ කාලේ වෙද්දිත් පළවෙනි ලෝක යුද්ධය, දෙවනි ලෝක යුද්ධය වගේ දේවල් එක්ක ලෝක දේශපාලනය, ලෝක ආරක්ෂාව කියන සාධකත් එක්ක ජාතික රාජ්‍ය කියන ඒකකය වැදගත් ඒකකයක්. එතකොට අපිට සිද්ධ වුනේ අපි වගේ යටත්විජිතවලට කොහාම හරි අපේ තියෙන යථාර්ථයන් ගලප්පා ගෙන අර ක්‍රමයට fit වෙන්න. එහෙම නැතිනම් අපිට පරිකල්පනය කරන්න ඒ වෙලාවේ හැටියට අපිට තේරුමක් නැහැ මේ ක්‍රමය හරි ද වැරදි ද කියලා. මොකද අපි යටත්විජිතයක් වෙලා ඉඳලා දැන් තමයි ස්වාධීන රාජ්‍යයක් බවට පත්වෙන්නේ. එතකොට පැවති යම්කිසි ව්‍යුහයකට අපිට වෙනවා අනුගත වෙන්න. එතකොට ඒ අනුගතවීම සිද්ධ වෙන්නේ වෙන කවුරු හරි හදපු කොන්දේසි ටිකකට. අපි කොහොමද මේ ජාතික රාජ්‍ය ඇතුලේ ඒ ආයතන පද්ධතිය, දේශපාලන ආයතනික පද්ධතිය ඇති කර ගන්නේ කියලා තිබ්බ ආකෘතිවලට අනුව තමයි අපිට කරන්නෙ වෙන්නෙ. යම්කිසි විදියකට අපෙත් යටත්විජිත පාලකයන් විසින් අත්හදා බලමින් ආපු යම්කිසි පද්ධතියක් තිබ්බා. ඒ ටික අපේ ලොක්කන් විසින් නැවත ක්‍රියාත්මක කරගෙන ගියා. එහෙම බැලුවාම අපි ඉන්න සමාජය ගත්තාම අපිට ඕන විදියට මේ game එකේ rules අපි නෙමේ set කරගෙන තියෙන්නේ. අපිත් නෙමේ අපේ ලොක්කනුත් නෙමේ ඇත්තටම. අපේ ලොක්කනුත් කලේ කවුරු හරි set කරලා තිබ්බ terms ටිකකට adopt වෙන්න හදපු එකක්. එතකොට ඒ adoption එකේදී මම හිතනවා ලෝක දේශපාලනය ඇතුලේ ප්‍රධාන කාරණා දෙකයි අවධානය යොමු කරන්නෙ. සාමය හා සංවර්ධය. සාමය ළඟා කරගන්න පුළුවන් මෙන්න මේ විදියටයි, සංවර්ධනය ළඟා කරගන්න පුළුවන් මෙන්න මේ විදියටයි කියලා පැවති අධිපති අදහස් ටික තමයි අපේ භූමියටත් එන්නේ. එතකොට ඒ එන ක්‍රියාවලිය ඇතුළේ අපිව නියෝජනය විමක් නැහැ. සොක්කනුත් නැහැ, ලොක්කනුත් නැහැ. ලොක්කන්ටත් ඒ දෘෂ්ටිවාදී හැකියාව, පරිකල්පනය කිරිමේ හැකියාව ඒ වෙලාවේ නැහැ. මොකද යටත්විජිත වෙලා ඉඳලා තමයි එන්නේ සහ අපේ බලය මාරු වෙද්දි අපේ හිටපු ලොක්කන් ඇවිල්ලා ඇත්තටම අපේ විතරක් නෙමේ


යටත්විජිත ගණනාවක බටහිර අධ්‍යාපනයෙන් ඉගෙන ගෙන ආපු ලොක්කන්. එතකොට ඔවුන්ටත් වෙනත් යමක් පරිකල්පනය කරන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. අර දන්න ආකෘතිවලට වැඩිය අමතර යමක්.

ඉතිහාසයේ කවදා ද අපිට හිතන්න තිබ්බේ කියන ප්‍රශ්නය මම අහන්නේ. එතකොට දැන් අපි කලේ කොහෙන් හරි ගත්ත ටිකකට අපි adopt වෙන්න උත්සහ කිරීමක්. ඒකේ බරපතලම තත්ත්වය තමයි මම හිතන්නේ අර ජාතික රාජ්‍ය කියන ආකෘතියට fit වෙන්න ගත්ත අසාර්ථක උත්සහය. මොකද ඒකෙ අදහස තමයි එක ජාතියක් තමයි රාජ්‍යයක් වෙන්නේ කියන එක. එතකොට state building වලට වැඩිය අපි nation building ද? අපිට හිතාගන්න බැහැ අපි කවුද කියල. පාලන ඒකකයක් වෙන්න නම් එක ජාතියයි. දැන් කවුද මේ ජාතිය ? කවුද මෙකේ dominant ජාතිය ? කවුද මේකේ rules set කරන්නේ ? එතකොට ඒකත් එක්ක නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය. එහෙම නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණ එක්ක ගත්තාම කාට ද ඡන්ද වැඩි, මේක සංඛ්‍යාත්මක තැනකට ලඝු වෙනවා. ඒ ලඝු වුණාම අපේ වගේ රටක ඒක සංකීර්ණ තත්ත්වයක් බවට පත් වෙනවා ජාතිය නිර්මාණය කර ගැනීම කියන එක. මොකද ජාතිය කියන එක ඒ වෙද්දි යටත්විජිත ඉතිහාසයත් එක්ක ජනවාර්ගිකත්වය මත තමයි ජාතිය කියන එක පරිකල්පනය කරන්නේ.

මම කියන්න උත්සාහ කරන්නේ අපේ සොක්කන්, ලොක්කන් නොවන පිරිසකගේ ඒ ලක්ෂණ ටික ස්වදේශීක අදහස්වලින් විතරක්ම නෙමේ. ඊට වැඩිය ගෝලීය ධාරාවන්වලිනුත් shape වෙලා තියෙනවා කියන එක. ඒ අතින් බැලුවාම අපි මේ ඉන්න සුවිශේෂී කාලයේ ලංකාවේ ක්‍රියාකාරීත්වය තේරුම් ගැනීම ලංකාවට විතරක් නෙමේ විශේෂයෙන් ගෝලීය දකුණ හා ලෝක දේශපාලනය ඇතුලේ ජනයා කියන්නේ කවුද කියන එක තේරුම් ගැනීමත් මං හිතනවා ඉතාම වැදගත් කියල. අනිත් පැත්තෙන් ගත්තාම ප්‍රජාතන්ත්‍රවාදය උපයෝගිතාමය අදහසින් ප්‍රායෝගිකව පවත්වා ගෙන යාමේ ආකෘතිය හැටියට තේ පක්ෂ දේශපාලනය අපි දකින්නේ. පක්ෂ තමයි තියෙන්නේ, පක්ෂ තමයි සංවිධානාත්මක ව්‍යුහයන්. ඒගොල්ලන්ට පුලුවන් යම්කිසි අදහස් පද්ධතියක් වෙනුවෙන් පෙනී සිටින්න. එතකොට ඡන්දදායකයින් ඉන්නවා, ඡන්දදායකයින් ඇවිල්ලා ඡන්දයකදී ප්‍රතිපත්ති ප්‍රකාශන දිහා බලලා මේගොල්ලන්ට ඡන්ද දුන්නොත් මේගොල්ලෝ මෙන්න මෙහෙම කරාවිය කියන විශ්වාසය මත පවතින ව්‍යුහයක් මේකේ තියෙන්නේ. දැන් මේ පක්ෂ ක්‍රමය මුළු ලෝකයේම එක්තරා විදියකට අර්බුදයකට ගිහිල්ලා තියෙනවා. එක උදාහරණයක් මම කියන්නම්, නවසීලන්තයේ 2017 පැවති මැතිවරණයේ දී ජසින්ඩා අගමැතිනිය හැටියට පත්වෙන්නේ. හැබැයි ඇත්තටම ඒ ඡන්දයේදී ආසන 56ක් ඒ කියන්නේ බහුතර ආසන සංඛ්‍යාව දිනා ගත්තේ ජසින්ඩා ගේ පක්ෂය නෙමේ. ජසින්ඩාගේ පක්ෂය Labour පක්ෂය. National කියන පක්ෂය තමයි වැඩිපුර ආසන සංඛ්‍යාවක් දිනා ග ත්තේ. ඒ පක්ෂ දෙක තමයි ප්‍රධාන පක්ෂ නවසීලන්තයේ. ඊට අමතරව Newzeland First, පරිසරය ගැන වැඩ කරන පක්ෂ තියෙනවා. ඒවාට කුඩා ආසන සංඛ්‍යාවන් හිමි වෙනවා. දැන් National කියන පක්ෂයට බැරි වෙනවා රජයක් පිහිටුවන්න. ඒගොල්ලොන්ට බැරිවෙනවා අනිත් අයත් එක්ක කතා කරලා ආසන සංඛ්‍යාව හදාගන්න. ඒ negotiation යන අතරවාරේ ජසින්ඩා බොහෝම smart විදියට තුන්වෙනියට වැඩිපුර ආසන සංඛ්‍යාවක් දිනාගත් Newzeland First කියන (Newzeland First කියන්නේ නවසිලන්තයේ තියෙන extremist ideology එකක් තියෙන පක්ෂයක්) පක්ෂයත් එක්ක කවුරුත් හිතන්නැති විදිහට එකතු වෙනව. එහෙම සංධානයක් ඇතිවෙයි කියන possibility එක ගැනවත් කවුරුත් හිතන්නේ නැහැ. හැමෝම National කාත් එක්ක ද එකතු වෙන්නෙ කියලා බලන් ඉන්න අතරවාරේ ජසින්ඩා තමන්ගේ ආසන සංඛ්‍යාව හදා ග න්නවා. National කියන්නේ liberal අදහස් තියෙන එකක්, labour කියන්නේ ටිකක් වාමාංශික අදහස් තියෙන එකක්. බහුතරය National පක්ෂයට වුණාට ඇත්තටම බලයට එන්නේ ලේබර් පක්ෂය extremist අදහස් තියෙන anti migration rules වලට back කරන Newzeland First කියන පක්ෂයේ නායකයාව නියෝජ්‍ය අගමැති කරලා. එතකොට මේක නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ උභතෝකොටිකයක් නෙමේ ද? අපි කතා කරන්නේ නවසිලන්තය ගැන. අපි නවසීලන්තය ගැන හිතන්නේ හිතන්නේ one of the best democracies කියල. නවසීලන්තයෙ විතරයි ඡන්ද බලය තියෙන්නේ නේවාසිකයන්ට (resident), පුරවැසියෙක්වත් වෙන්න ඕනි නැහැ. එච්චර ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයකත් අර වැඩේ තමයි වෙන්නේ. එතකොට අපිට තේරේනවා අපේ භූමියේ තියෙන ප්‍රශ්න. එක පැත්තකට මේ game එකේ rules set කරන වෙලාවේ තිබ්බ ප්‍රශ්නවලට තවත් complicated වෙලත් තියෙනවා, ඒවා අපිට පේන්නත් තියෙනවා. ඉස්සරත් මේ ප්‍රශ්න තියෙන්න ඇති. නමුත් ඒ කාලයේ 30 ගණන්වල තිබුණාට වැඩිය දැන් තියෙන ප්‍රශ්නවල ස්වභාවය වෙනස්, ඒවා සංඛ්‍යාත්මකව වෙනස්, ගැඹුරත් වෙනස්. එතකොට මේ වගේ අවස්ථාවක ground එකේ යථාර්ථය ගොඩක් අවුල් වෙලා තියෙන වෙලාකවක ඒ ටික ඔක්කොම නියෝජනය වෙන විදියට ප්‍රජාතන්ත්‍රවාදී

ආයතන පද්ධතියක් හදා ගන්නේ කොහොම ද? පක්ෂ කියන ව්‍යුහයට පුළුවන්ද ප්‍රජාතන්ත්‍රවාදය නිවැරදිව ප්‍රතිනිෂ්පාදනය කරන්න පාලනය කිරීමේ ක්‍රියාවලියේ දී. එහෙම බැරි නම් මොනවාද අපිට තියෙන විකල්ප. ඒක මම කැමතියි මේ සභාවට ඉදිරිපත් කරන්න ප්‍රශ්නයක් හැටියට. අපි මේක ලංකාවට විතරක් සුවිශේෂී එකක් හැටියට දකිනවා. ඒ වගේම ගෝලීය ප්‍රජාතන්ත්‍රවාදයේ අපි ඉන්නේ. දෙවන ලෝක යුද්ධයෙන් පස්සේ විශේෂයෙන් සෝවියට් සමූහාණ්ඩුව බිඳ වැටුණාට පස්සේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ලිබරල් ධනවාදය කියන ඒ ආකෘතිය නේ ප්‍රබල (dominant). ඒ වගේ වේලාවක අපිට තියෙන එක වෙනස් කරගන්නේ කොහොම ද අපි ? මොන අතට ද? කියන ප්‍රශ්නය මම කැමතියි ඇත්තටම සභාවට දාන්න. තව එක කාරණාවක් කියන්න කැමතියි. ලංකාවේ අරගලයේ (පශ්චාත් අරගලය කියන එකට මටත් ප්‍රශ්න තියෙනවා) මම හිතනවා එතන නීතියේ උභතෝකෝටියකුත් තියෙනවා. නූතන සමාජයේ අපි හැමෝම කැමතියි යහපත් පුරවැසියන් (obedient citizens) විදියට පෙනී සිටින්න. ලෝක දේශපාලනයෙත්, රටවලුත් කැමතියි. හැම රටක්මත් කැමතියි හරිම නිවැරදි රටක් හැටියට පෙනී සිටින්න, ඇත්තටම මොන වැඩ කළත්. අපි හැමෝම කැමතියි හොඳ පුරවැසියන් ලෙස පෙනී සිටින්න. අපි අරගලයේදීත් අපි හැම තිස්සෙම අපේ එකට සම්බන්ධ වෙච්ච අය නීතිය ඇතුලේ සිටිමින් තමයි තමන්ගේ ප්‍රතිවිරෝධතාව පෙන්නුවේ. ඒක civil disobedience කියන තත්ත්වයකට ගියේ නැහැ. නීතිය කඩලා අපි අපේ විරෝධතාවය පෙන්වනවා කියන තැනකට ගියේ නැහැ. හැම තිස්සේම නීතිය ඇතුළේ ඉඳගෙනම, ව්‍යවස්ථාව ඇතුලේ ඉඳගෙන තමයි අපි ප්‍රතිවිරෝධතාව දැක්වූයේ. ඒක අවසානයේ රනිල් පත්වෙනව. බැලු බැල්මට යුක්තිය අතින් බැලුවොත් අපිට පේනවා මේක අවුල්, මේක වැරදියි. mandate එකක් නැහැ. mandate reverse කරලා තියෙන්නේ. ඒ reverse කරපු mandate එක උඩ ආපහු බලය මාරුවෙලා තියෙනවා. හැබැයි අනිත් පැත්තට රනිල් කියනවා අපිටල "මම කිසිදෙයක් ව්‍යවස්ථාවට පිටින් කරන්නේ නැහැ". හැමදාම කියනවා, මම හිතන්නේ දවසට තුන් හතරවතාවක් කියනවා. මම හිතනවා අපේ පුරවැසියන් කැමතියි මම හිතන්නේ නීත්‍යානුකූලව හොඳට ක්‍රියාත්මක වෙන පුරවැසියන් හැටියට පෙනී සිටින්න. මේක තමයි නීතිය, නීතියට අනුව මේක හරි කිව්වාට පස්සේ අපිට ඒක තමයි අපේ end point එක වගේ හිතන ගතියක් අපේ තියෙනවා. මං හිතනවා නැවත වතාවක් ගෝලීයව හදලා තියෙන ideology එකක් තමයි, නීතිය තමයි සියල්ලට ඉහළින් ඉන්නේ කියන එක. නීතිය ද සියල්ලට ඉහළින් ඉන්නේ, එතකොට නීතිය හදන්නේ කවුද? නීතියෙන් මොකක් ද reflect වෙන්න ඕනි. නීතියෙන් reflect වෙන්න ඕනි යුක්තිය නෙමේද ? යුක්තියත් නීතියත් එකිනෙකට පරස්පර වෙන තැනකදී අපි හිටගන්න ඕනි නීතියේ පැත්තද? යුක්තියේ පැත්ත ද? මේක නීතියේ එක්තරා විදියක උභතෝකෝටිකයක් හැටියට කියන එකත් මම කියන්න කැමතියි. ඛේදනීයම දේ තමයි මේක පැහැදිලි කරන්න නීති විශාරදයන්ටත් අමාරුයි. ඒකෙන් පෙන්වනවා අපි දන්න දැනුමේ සීමාව. අපි නීතිය ඉගෙන ගන්නේ නීතිය ඇතුලේ විතරයි. නීතියෙන් serve වෙන දේ අපි බලන්නේ නැහැ. ආර්ථික විද්‍යාඥයින් ගැන කිව්වා එයාලා බලන්නේ ආර්ථිකය විතරයි කියලා. මේ ඔක්කොගෙනිම කියවෙන්නේ මේ අපි set කරපු rules නෙමේ, අපි ඉන්නෙ අනුන්ගෙ game එකක කියන එක. අපිට අවශ්‍ය මොනවා ද කියන එක යම්කිසි වෙනත් විවිධ ප්‍රවාහයන් විසින් ගෝලීය, ඓතිහාසික, රදළ, යටත්විජිත ප්‍රවාහ විසින් නිර්මාණය කරලා තියෙනවා. ඒවා කොච්චර බලවත් ද කියනවා නම් අපිට එවායින් එහාට පෙන්නේ නැහැ. අපි ඉන්න ආයතන පද්ධතිය ගත්තොත්, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ගත්තොත් ඒ මොනවා හරි ව්‍යුහයන්ට එපිටින් ඇත්තටම අපිට ඕනි දේ reflect වෙන, අපට අවශ්‍ය දේ සිදුවෙන ක්‍රමයන්, ආයතන, අදහස් පද්ධතීන් ගැන පරිකල්පනය කරන්න අපිට අමාරුයි. මොකද හැම තිස්සේම අපි අලුත් දෙයක් දිහා බලන්නේ අපි දන්න දේවල් ඇසුරින්. අපි දන්න දේ තුළින් තමයි නොදන්නා අලුත් දේ බලන්නේ. ඒක challenging task එකක්. නමුත් මං හිතන්නේ නැහැ ඒක impossible task එකක් කියලා. පොඩි උදාහරණයක් කිව්වොත් මගේ යාලුවෙක් ඉන්නවා තරුණ විදුහල්පතිවරයෙක්. අවුරුද්දකට විතර කලින් ඔහු මහින්ද රාජපක්ෂ විද්‍යාලය ගැන මට කිව්ව. මහින්ද රාජපක්ෂ විද්‍යාලය කියන්නේ විශාල විද්‍යාලයක්. ළමයි 8,000ක් විතර ඉන්නවා කියලා ඔහු මට කිව්වේ. ඔහු කිව්වේ විදුහල්පතිවරු හා පාසල් බලධාරීන් අතර දැනට තියෙන සාකච්ඡාව තමයි පාසල් කුඩා වෙන්න ඕනි, පාසැල්වල ඉන්න දරුවන් ප්‍රමාණය කුඩා වෙන්න ඕනි, පන්ති කාමරවල ඉන්න දරුවන් ප්‍රමාණය කුඩා වෙන්න ඕනි, ගුරුවරුන් හා දරුවන් සංඛ්‍යාව අතර අනුපාතය අඩු වෙන්න ඕනි වගේ දේවල්. ඒ සාකච්ඡා එහෙම තිබිය දී මහින්ද රාජපක්ෂ විද්‍යාලය කියලා ළමයි 8,000 ක් ඉන්න පාසලක් නිර්මාණය කරනවා. එතකොට ඒ පාසල නිර්මාණය කරන්නේ කවුරුන් වෙනුවෙන් ද? මගේ යාලුවා මට කියනවා හේතුව. ඒ තමයි දකුණු ආසියාවේ ලොකුම පාසල තියෙන්නේ ලංකාවේ කියලා කියන්න තමයි ඒ පාසල නිර්මාණය කරන්නේ. ඒ පාසල නිර්මාණය කරන්නේ අපේ ළමයින්ට අධ්‍යාපනය දෙන්න හෝ

ඒගොල්ලන්ට හොඳටම හරියන අධ්‍යාපන setup එක මොකක් ද කියන අදහසින් නෙමේ. වෙන මොකක් හරි අවශ්‍යතාවකට තමයි ඒක හදන්නේ ? එතකොට මගේ යෝජනාව තමයි මේ එළඹිලා තියෙන සංක්‍රාන්තික කාල සීමාව ඇතුලේ අපිට සිද්ධ වෙනවා ජනයාව කේන්ද්‍රයේ තියලා අපි මේ හිතන ඔක්කොම ටික ආයතන පද්ධති වෙන්න පුළුවන්, සංවර්ධන ක්‍රියාවලින් වෙන්න පුළුවන් ඒ හැම දෙයක්ම පරිකල්පනය කරන්න උත්සහ කරන්න. ඒක සිදු වෙමින් පවතින බවක් පේන්නේ නැහැ ඇත්තටම. අද උදේ අධ්‍යාපනය ගැන විශේෂ කමිටුවක ඉඳලා මම ආවේ, එතන තිබ්බ සාකච්ඡාව තමයි අපි කොහොම ද වෘත්තීය අධ්‍යාපනය වැඩි වශයෙන් දීලා ශ්‍රමිකයින්ව පිටරටට, විශේෂයෙන් මැද පෙරදිග යවන්න පුළුවන් පුහුණු ශ්‍රමිකයන් බවට පත් කරන්නේ කොහොම ද කියන එක. ඒ සාකච්ඡාව සමානයි 1980 ගණන්වල උතුරේත් දකුණෙත් ප්‍රශ්න හා රැකියා විරහිතභාවය නිසා ගෘහ සේවිකාවන් විදියට මැද පෙරදිගට ශ්‍රමිකයන් යවමු, එතකොට තමයි අපිට ඩොලර් එන්නේ කියන එකට. ඒක තමයි දැන් මේ කරන්න යන්නේ. නමුත් අපිට පාඩමක් තියෙනවා. එහෙම යැව්වා කියලා සල්ලි එන්න පුළුවන් හැබැයි ඒ ඇති වෙච්ච සමාජ ප්‍රශ්න චක්‍රය නැවත ඇති වෙන්න නියමිතයි. මොකද අපි නැවත වතාවක් මේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්නේ ජනතාවගේ කෝණයෙන් බලලා නෙමේ. මම එතනින් අවසන් කරනවා. ලොක්කන් සොක්කන් කියන දෙපිරිසක් ඉන්න බැහැ නේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් නම් තියෙන්නේ. ජනතාව නම් ජනතාව පාලනය කර ගන්නේ ලොක්කන් සොක්කන් කියලා දෙගොල්ලක් ඉන්න බැහැ නේ. එතකොට මූලධාර්මිකව බැලුවත් කොහොමද අපි ඒ බල විෂමතාවය වෙනස් කරන්නේ? කාටද එකේ වගකීම තියෙන්නේ ? මම හිතනවා විශේෂයෙන් ජනතාව කේන්ද්‍රයේ තියලා මේ හැම දෙයක්ම පරිකල්පනය කළයුතුයි කියල. මේක ලංකාවට විතරක් සුවිශේෂි task එකක් නෙමේ. මම හිතනවා ලෝකයේ අපිට වගේ ඉතිහාසයක් තියෙන රටවල්වලට තියෙන ප්‍රශ්නයක් ඒක. ඒ අදහසින් ලංකාව සම්බන්ධයෙන් මේ කරන කතාබහ ඉතාම වැදගත් කියලා මම හිතනවා.




**නීතිය හා සමාජ භාරය**
**අංක 03, කින්සි ටෙරස්,**
**කොළඹ 08,**
**ශ්‍රී ලංකාව**
**දුරකතන :+ 94 (0) 112684845**
**ෆැක්ස් :+ 94 (0) 112686843**
admin@lstlanka.org
www.lstlanka.org